DOI: 10.31357/fhssmst.2009.00023

# දේශීය ශාන්තිකර්මයන්හි පිළිබිඹු වන මනෝචිකිත්සක ලක්ෂණ පිළිබඳ ව කෙරෙන විමර්ශනයක්.
## (සපරගමුවේ ශාන්තිකර්ම ඇසුරින්)

විතාරමලාගේ ධනවර්ධන
ලි.ප.අං.GS/HU/1532

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා
භාෂා හා සංස්කෘතික අධ්‍යයන විෂය යටතේ
ඉදිරිපත් කරන නිබන්ධනයයි.

## අපේක්ෂක ප්‍රකාශය

"මේ නිබන්ධයේ අන්තර්ගතය මහාචාර්ය ආනන්ද ගුණසිංහ මහතාගේ සහ මහාචාර්ය ඥානදාස පෙරේරා මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණ වාර්තාව කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට, ආයතනයකට හෝ වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නො කරන ලද බවත් සහතික කරමි."

නම: විතාරමලාගේ ධනවර්ධන.

අත්සන: ..................................................

## සුපරීක්ෂක ප්‍රකාශය

මෙම අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත් මේ නිබන්ධය ඇගයීම් කාර්ය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව 2009.08.28 දින පැවැති වාචික පරීක්ෂණයේදී පෙන්වා දුන් සංශෝධනයන් සහිත ව ඉදිරිපත් කෙරෙන බවත් ප්‍රකාශ කර සිටිමු.

| සුපරීක්ෂකගේ නම | අත්සන | දිනය |
| --- | --- | --- |
| 1. [illegible] | [illegible] | 08/12/2009 |
| 2. [illegible] | [illegible] | 09/12/2009 |

# උපකාරානුස්මෘති

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ගුණාත්මක බවකින් යුතුව සම්පාදනය කර ගැනීමෙහිලා මා හට නන් අයුරින් උපකාර කළා වූ බොහෝ පිරිස් වෙත්. ඔවුන් පිළිබඳව ඉතා කෙටියෙන් හෝ ස්මරණයක යෙදීම මාගේ යුතුකමක්ව පවතී.

මෙවැනි අධ්‍යයනයකදී අනුගමනය කළ යුතු ශාස්ත්‍රීය ක්‍රමවේදයන් හඳුන්වා දෙමින් මාව නිසි මගකට යොමු කරවීමෙහිලා කටයුතු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයන අංශයේ හිටපු අංශ ප්‍රධාන මහාචාර්ය බණ්ඩාර මැණිකේ විජේතුංග මහත්මිය ද, වර්තමාන අංශ ප්‍රධාන ආචාර්ය සමන් චන්ද්‍ර වීරසිංහ මහතා ද මෙහිදී ගෞරවයෙන් සිහිපත් කරමි.

මෙම අධ්‍යයන කාර්යය ආරම්භයේ සිට මාගේ උපදේශකවරුන් වශයෙන් කටයුතු කරන ලද්දේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්ය ආනන්ද ගුණසිංහ මහතා සහ මෙම විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මනෝවෛද්‍ය නිශාන්ති දොළගේ මහත්මියත් ය. මෙවැනි මාතෘකාවක ඇති වැදගත්කම හා කාලීන වශයෙන් එහි ඇති අවශ්‍යතාව පෙන්වා දෙමින් මෙම අධ්‍යයනයෙහි ගුණාත්මක සංවර්ධනය කෙරෙහි නිරන්තරයෙන්ම මා වෙත මග පෙන්වා දුන් මහාචාර්ය ආනන්ද ගුණසිංහ මහතා මෙහිදී ඉතා ගෞරවයෙන් සිහිපත් කිරීම මාගේ යුතුකමක් කොට සළකමි.

ඒ සමගම වෛද්‍ය දොළගේ මහත්මිය බොහෝ අවස්ථාවන්හිදී මා කළුබෝවිල මහ රෝහලේ මනෝවෛද්‍ය පුහුණු පාසල වෙත කැඳවා එහි සිටින මනෝ වෛද්‍යවරුන් සමග සමූහ සාකච්ඡාවකට අවස්ථාව සලසා දී එමගින් ඇතැම් විෂය කරුණු ගොනු කර ගැනීමට සලසා දීම සම්බන්ධයෙන් මාගේ කෘතඥතාවය එතුමිය වෙත ද පළ කර සිටිමි.

අනතුරුව වෛද්‍ය දොළගේ මහත්මියට විදේශ ගතවීමට සිදුවූ බැවින් ඒ වෙනුවට මෙම විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඥානදාස පෙරේරා මහතා පත් කරනු ලැබීය. මෙහිදී අධ්‍යයන ක්ෂේත්‍රය හා සම්බන්ධ මනෝ විද්‍යාත්මක විෂය කරුණු නිරවුල් කොට පෙන්වා දෙමින් මා නිවැරදි මගකට යොමු කරවීමෙහි ලා එතුමාගෙන් ලැබුණු කාරුණික අනුග්‍රහය ද ගෞරවයෙන් සිහිපත් කරමි.

මෙම පාඨමාලාව හැදෑරීම සඳහා වන පාඨමාලා ශාස්ත්‍ර ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමත ගෙවීම්වලට යටත්ව ලබා දීමෙන් මා වෙත දැක්වූ අනුග්‍රහය ද මෙහි දී අගය කොට සලකන අතර මෙම නිබන්ධන කෘතිය මැනවින් පරිගණක අක්ෂර සංයෝජනය කර දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ සේවයේ නියුතු කාන්ති ඒකනායක මහත්මියට ද මාගේ ප්‍රශංසාව හිමි වේ.

විතාරමලාගේ ධනවර්ධන
ජාතික අධ්‍යාපන ආයතනය
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මහරගම.
2007.12.06

# දේශීය ශාන්තිකර්මයන්හි පිළිබිඹුවන මනෝචිකිත්සක ලක්ෂණ

## (සපරගමුවේ ශාන්තිකර්ම ඇසුරින්)

විතාරමලාගේ ධනවර්ධන

## නිබන්ධ සාරාංශය

මෙහි පළමු පරිච්ඡේදය යටතේ මෙම අධ්‍යයනයේ අරමුණු හා එහි විෂය ක්ෂේත්‍රය පිළිබඳ හැඳින්වීමක් කර ඇත. එහි දී ඓතිහාසික හා නූතන සාහිත්‍යමය මූලාශ්‍රගත සාධක පිරික්සා බලමින් මෙම චිකිත්සා ක්‍රමයන්හි ප්‍රභවය හා විකාශය සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කොට ඇත. ඒ සමග ම මෙම අධ්‍යයනයේදී අප විසින් අනුගත ක්‍රමවේදයන් ද එහිලා සවිස්තර ව දක්වා ඇත.

මෙහි දෙවන පරිච්ඡේදය වෙන්කොට ඇත්තේ සපරගමුවේ සමාජ, සංස්කෘතික පසුබිම හා එහි පවත්නා ශාන්තිකර්ම ආදිය හඳුනා ගැනීමක් කෙරෙහි ය. එහිදී අතීතයේ පැවැති හා වර්තමානයේ ප්‍රචලිත ව පවත්නා යක්තොවිල්, මඩුතෝත්‍ර හා බලියාග ආදී පිළිවෙත් ක්‍රමවල ආරම්භය විකාශය හා ඒවායෙහි වර්තමාන ස්වරූපය කෙබඳුදැයි යන්න හඳුන්වා දී ඇත. අනතුරු ව මෙම චිකිත්සා ක්‍රමවලදී ලෙඩරෝග හඳුනා ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන සිද්ධාන්ත හා මූලධර්ම ආදී කරුණු මෙහි තෙවන පරිච්ඡේදය යටතේ විග්‍රහයට ලක් කෙරේ. එහි දී ප්‍රථමයෙන් මෙම ප්‍රතිකාර ක්‍රමවලට ලක් කෙරෙන රෝගාබාධ අතුරින් සාම්ප්‍රදායික ව්‍යවහාරයේ පැවැත එන භූතරෝග හැටියට සැළකෙන රෝගාබාධත් නූතන ව්‍යවහාරයේ පවත්නා මානසික රෝග හැටියට සැලකෙන රෝගාබාධ සහ ඒවායෙහි ස්වභාවයත් විමසා බලන ලදී.

අනතුරු ව මෙබඳු රෝගාබාධ සුව කිරීම සම්බන්ධයෙන් නූතන මනෝවෛද්‍ය ක්ෂේත්‍රයෙහි භාවිත චිකිත්සා ක්‍රමයන් කෙරෙහි ද අවධානය යොමු කරමින් අපගේ සාම්ප්‍රදායික චිකිත්සා ක්‍රමයන් ඇගයීමට ලක් කර ඇත.

ඒ අනුව ප්‍රථමයෙන් යක්තොවිල්වල භූතරෝග නිවාරණය කරන විට ආවේශ කිරීම මාර්ගයෙන් රෝගියාට මනෝචිකිත්සනයට මඟ සලසන ආකාරය විමසා බැලීම්. එහි දී රෝගියා මනෝවශීකරණයට ලක්කොට චිත්තාරාධනයෙන් (Suggestion) රෝග සුව කරලීමට මග සලසන ආකාරය ද ඒ සඳහා මනෝවිශ්ලේෂණ (Psychoanalytic) හා මානසික ව පොළඹවා ගැනීම් හෙවත් අභිප්‍රේරණ Motivation වැනි ක්‍රමෝපායයන් ඇසුරු කරගන්නා ආකාරයත් සාකච්ඡාවට ලක් ව ඇත. මෙම චිකිත්සා ක්‍රමවල දී මෙරට සංස්කෘතිය පිළිගෙන ඇති ආකාරයට රෝගීනට තම රෝග කාරකයන් කවරහුදැයි යන්න ප්‍රකාශ කිරීමට ඉඩකඩ සළසා දෙන ආකාරයක් පෙනී ගියෙන් මනෝචිකිත්සාව විෂයෙහි එහි ඇති වටිනාකම් ද ඇගයීමට ලක් ව ඇත. ඒ සමග ම ආතුර මනස තුළ ධනාත්මක සිතුවිලි තහවුරු කිරීම (Afrimation) මාර්ගයෙන් ඔවුනට මානසික සුවය සළසා දීම සඳහා ගන්නා උත්සාහයන් ද මෙහි දී විමසා බැලේ.

අනතුරු ව යක්තොවිල්වලදී රෝගීනට බියට මුහුණ දීමට සැලැස්වීමෙන් (Exposure) යක්ෂයින් කෙරෙහි පවත්නා බිය පහකරලිම සඳහා ගනු ලබන උපාය මාර්ගයන් ඇගයීමට ලක් ව ඇත. එහිදී මෙබඳු බිය පහකරලීම් සම්බන්ධයෙන් නූතන මනෝ වෛද්‍ය ක්ෂේත්‍රයෙහි භාවිත චර්යා ප්‍රතිකාර ක්‍රමය (behaviour therapy) කෙරෙහි ද අපගේ අවධානය යොමු කෙරිණ.

ඒ සමග ම අධ්‍යාත්මික (spiritual) නොහොත් අධිමානසික චිකිත්සා (perapshycho theraphy) ක්‍රමයක් හැටියට පූර්වෝක්ත ප්‍රතිකාර ක්‍රමයන් ඇගයිය හැකි ද යන්න විමසා බැලිණ. එම කරුණ යටතේදී රෝග සුව කරන්නාත් සුවය ලබන්නාත් අතර ඔවුනොවුන් හදවතින් ම ඒකාත්මික භාවයකට යොමුවීම කෙරෙහි ගොඩනගා ගන්නා ලද පිළිවෙත් ක්‍රමයන් මෙහි දී සාකච්ඡාවට බඳුන් විය.

මේ හැර යක්කම් පෙළපාලි ආදියේ දී කෙරෙන අනුකරණාත්මක හා ප්‍රදර්ශන (modelling) ක්‍රියා ශාන්තිකර්ම මනෝචිකිත්සාව විෂයෙහි වැදගත් වන ආකාර ද විමසුමට ලක් ව ඇත. මෙම චිකිත්සා ක්‍රමවලදී රෝගීන් කායික හා මානසික වත්පිළිවෙත්වලට යොමු කරවීමෙන් රෝග සමනය කොට යථා තත්ත්වයට පත් කරවන (person is able to pain control through physical and mental rituals) ආකාරය එහිදී ඇගයීමට ලක් කෙරේ. එහි ලා නූතන මනෝ වෛද්‍ය ක්ෂේත්‍රයෙහි භාවිත මාර්ගෝපදේශණය හා උපදේශනය (guidance and counselling) වැනි ප්‍රතිකාර ක්‍රමයන්හි ලක්ෂණ පූර්වෝක්ත පිළිවෙත් ක්‍රමයන්හි ද පිළිබිඹු වන බවට තොරතුරු ඇතුළත් ය. මේ හැරුණු විට ශාන්තිකර්මයක ඇතුළත් සියළු අභිචාර ක්‍රම හා අඩුවැඩි වශයෙන් භාවිත වන නර්තන, ගායන, වාදන ආදියත් රංග උපකරණ, මෙවලම් හා සැරසිලි ආදියත් මනෝචිකිත්සාව විෂයෙහි වැදගත් වන ආකාරය සාකච්ඡාවට ලක් කෙරේ. මෙහි අවසාන පරිච්ඡේදය යටතේ ශාන්තිකර්ම හා බුදුසමය අතර ඇති සම්බන්ධතාව පිළිබඳ කරුණු විග්‍රහ කොට ඇත. එහිදී ත්‍රිවිධරත්නයේ බලය හා ශක්තිය මනෝචිකිත්සාව විෂයෙහි මූලික වශයෙන් පදනම් කොට ගෙන ඇති ආකාරය විමසා බැලේ.

## ග්‍රන්ථනාම සංකේත නිරූපණ විධි

| | | | |
|---|---|---|---|
| 1. | සි.ගැ.නා. | - | සිංහල ගැමි නාටකය |
| 2. | ස.ස.ශා.ලි. | - | සමාජවිද්‍යා සරළ ශාස්ත්‍රීය ලිපි |
| 3. | වෛ.සා. | - | වෛදික සාහිත්‍ය |
| 4. | මා.ශි.මු. | - | මානව ශිෂ්ටාචාරයේ මුල්යුගය |
| 5. | ලං.ප්‍රා.බෞ.ආ.වි. | - | ලංකාවේ ප්‍රාග් බෞද්ධ ආගමික විශ්වාස |
| 6. | ම.ව.ප්‍ර.භා. | - | මහාවංසය ප්‍රථම භාගය |
| 7. | පු.සි.ස්.ඇ. | - | පුරාණ සිංහල ස්ත්‍රීන්ගේ ඇඳුම |
| 8. | පැ.ලං.ආ.පු. | - | පැරණි ලංකාවේ ආගමික පුද පූජා |
| 9. | බු.ස.සැ.ජ.ඇ. | - | බුදු සමයෙන් සැකසුණ ජන ඇදහිලි |
| 10. | ල.ම.අ. | - | ලක්දිව මහායාන අදහස් |
| 11. | සි.වි.කෝ. | - | සිංහල විශ්වකෝෂය |
| 12. | පි.පරි. | - | පිරිතෙහි පරිණාමය |
| 13. | ස.ර.ව. | - | සද්ධර්මරත්නාවලිය |
| 14. | පො.ද.ක. | - | පොළොන්නරු දඹදෙණි කතිකාවත් |
| 15. | පු.වෘ. | - | පුරාවෘත්ත |
| 16. | වි.බා. | - | විජයබාහු 900 |
| 17. | ම.ලං.ඉ. | - | මධ්‍යකාලීන ලංකා ඉතිහාසය |
| 18. | ස.සං.ස. | - | සරණංකර සංඝරාජ සමය |
| 19. | ස.ලං. | - | සද්ධර්මාලංකාරය |
| 20. | වි.පු.ලං. | - | විදේශීන් දුටු පුරාණ ලංකාව |
| 21. | ස.ර.ක. | - | සද්ධර්ම රත්නා කරය |
| 22. | සැ.ශං. | - | සැවුල් සංදේශය |
| 23. | වැ.වි.ක්‍ර. | - | වැද්දන්ගේ විකාශන ක්‍රමය |
| 24. | සප.දර්. | - | සපරගමු දර්ශන |
| 25. | ස.සා.ධා. | - | සපරගමු සාහිත්‍ය ධාරා |
| 26. | රා.ව. | - | රාජාවලිය |
| 27. | සිං.වි.උ. | - | සිංහල විශ්වකෝෂ උද්ධෘත |
| 28. | සි.සා.ව. | - | සිංහල සාහිත්‍ය වංශය |
| 29. | ශා.ලි.ක. | - | ශාස්ත්‍රීය ලිපි හා කථා |
| 30. | කො.කං.ස. | - | කොහොඹා කංකාරිය හා සමාජය |
| 31. | සි.සා.ල. | - | සිංහල සාහිත්‍ය ලතා |
| 32. | සි.සා.ග්‍ර.ප්‍ර. | - | සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රදීපිකා |
| 33. | සිං.ද්‍ර.බ. | - | සිංහලයේ ද්‍රවිඩ බලපෑම් |
| 34. | ජ.ශ්‍රැ.වි. | - | ජනශ්‍රැති විද්‍යාව |
| 35. | ස.ර.ව. | - | සද්ධර්මරත්නාවලිය |

| | | | |
|---|---|---|---|
| 36. | බුදු.අල. | - | බුදුගුණ අලංකාරය |
| 37. | ම.ලං.ස. | - | මධ්‍යකාලීන ලංකා සමාජය |
| 38. | සීතා.පු. | - | සීතාවක පුරාණය |
| 39. | ගම්.පු. | - | ගම්මඩු පුරාණය |
| 40. | ප.ශා.සා. | - | පහතරට ශාන්තිකර්ම සාහිත්‍ය |
| 41. | වෛ.ශා.ඉ. | - | වෛද්‍ය ශෘස්ත්‍රයේ ඉතිහාසය |
| 42. | සු.සං. | - | සුශ්‍රැත සංහිතාව |
| 43. | ආයු.විම. | - | ආයුර්වේද විමර්ශන |
| 44. | සා.සං. | - | සාරාංගධර සංහිතාව |
| 45. | ස.ම.ලි. | - | සවිස්තරාත්මක මනෝ විද්‍යා ලිපිසරණිය |
| 46. | අසා.චර්. | - | අසාමාන්‍ය චර්යා |
| 47. | ශා.ලි. | - | ශාස්ත්‍රීය ලිපි |
| 48. | මද.පු. | - | මදනයක් පුවත |
| 49. | ආ.අ.ඉ.මූ. | - | ආයුර්වේද අධ්‍යයන ඉතිහාස මූලධර්ම හා සමගාමී සංකල්ප |
| 50. | ද.ස.වි. | - | දහඅට සන්නිය හා එහි අන්තර්ගත කරුණු පිළිබඳ විග්‍රහයක් |
| 51. | ත.ඔ.ම. | - | තල්පතක ඔසු මහිම |
| 52. | අ.මා.වි. | - | අධිමානසික විද්‍යාව |
| 53. | ම.ගු.ම.වි. | - | මනෝවිද්‍යාව ගුරුකුල හා මනෝ විද්‍යාඥයෝ |
| 54. | ප්‍ර.ම.වි. | - | ප්‍රතිකාර මනෝ විද්‍යාව |
| 55. | ළ.ම.වි.ප්‍ර. | - | ළමා මනෝ විද්‍යාවට විශ්ලේෂණාත්මක ප්‍රවේශයක් |
| 56. | ස.ම.ලි.ස. | - | සවිස්තරාත්මක මනෝවිද්‍යා ලිපි සරණිය |
| 57. | ආයු.සමී. | - | ආයුර්වේද සමීක්ෂාව - පළමු වෙළුම, තෙවන කළඹ |
| 58. | කා.මා.සු.ය.ම. | - | කායික මානසික සුවය සඳහා යන්ත්‍ර මන්ත්‍ර භාවිතය |
| 59. | ද.යා.වි. | - | දහඅට සන්නි යාග විධි විමර්ශන |
| 60. | අ.ආ.ඔ. | - | අඩවි ආවේශ හා ඔල්මාද |
| 61. | වෛ.ශා.ස්ව. | - | වෛද්‍ය ශාස්ත්‍රයේ ස්වභාවය |
| 62. | කෙ.එ.පන්. | - | කෙළෙස් එක්දහස් පන්සියය |
| 63. | බුදු.හාමු. | - | බුදුහාමුදුරුවෝ |
| 64. | සි.ශ.කෝ. | - | සිංහල ශබ්ද කෝෂය |
| 65. | සි.ං.ශබ්. | - | සිංහලාර්ථ සහිත සංස්කෘත ශබ්දාර්ණවය |
| 66. | ප්‍රා.සිං.ශබ්. | - | ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය |
| 67. | ශ්‍රී.සු.ශබ්. | - | ශ්‍රී සුමංගල ශබ්දකෝෂය |
| 68. | සි.ශ.කෝ. 21 | - | සිංහල ශබ්දකෝෂය. 21 කාණ්ඩය හෙවත් 41 භාගය |
| 69. | සිං.දේ.වි. | - | සිංහල දේශීය විශ්වකෝෂය |

**English**

1. Go.Bo. - The Goldern Bough
2. Hi.Re.Is.Ce. - An Historical Relation of the Island Ceylon
3. Ce. - Ceylon Vol.II. Zixth Edition
4. Si.-Ve. - Sinhala Verse (Kavi)
5. God. Pat. - The Cult of the Goddes Pattini
6. Au. Sri. - Aurveda in Sirilanka
7. Ri.Dra.Sa.De. - The Ritual Drama of the Sanni Demonz.
8. Ce.De. Ex.Ae.He.Sri.- Acelebration of Demons Exorcism and the Aesthetic of Healing in Sirilanka.
9. Gre.Tra.Li.Per,Sin.Bu.- The Great Tradition and the Little in the Perspective of Sinhalese Buddhism.
10. Psy.Aspe.Ja.Sto. - Psychatric Aspects of Jataka Stories
11. Ri.Dr.Sa.De - The Ritual Drama of the Sanni Demons.
12. A.Ce.De.Ex,Ae.Siri - A Celebration of Demons Exorcism and the Aesthetic of Healing in Sirilanka.
13. The.Gre.tra.Li.per,Si.Bu.- The Great tradition and the little in the prespective of Sinhalese Buddhism.
14. The.Bu.Co.Bo.Le.- The Buddhist Concept of mind Bodhi Leves.
15. ThePe.Ce. - The People of Ceylon.
16. Psy.As.Ja.Sto. - Psychiatric Aspects of Jataka Stories.
17. Para.Psy. - Parapsychology

# පටුන

පිටුව

උපකාරානුස්මෘති i

නිබන්ධන සාරාංශය iii

ග්‍රන්ථනාම සංකේත නිරූපණ විධි v

පටුන viii

පළමු පරිච්ඡේදය

1.1 හැඳින්වීම 1-3

1.2 සාහිත්‍යයික විමර්ශන 4-16

1.3 ක්‍රමවිද්‍යාව 17-18

දෙවන පරිච්ඡේදය

2. සපරගමුවේ සමාජ සංස්කෘතික පසුබිම හා එහි පවත්නා ශාන්තිකර්ම 19-52

2.1 සපරගමුවේ සමාජ හා සංස්කෘතික පසුබිම

2.2 සපරගමුවේ ශාන්තිකර්ම

2.2.1 සපරගමුවේ මඩුයාග

2.2.2 සපරගමුවේ යක්තොවිල්

තුන්වන පරිච්ඡේදය

3. ශාන්තිකර්ම ආශ්‍රිත ව ලෙඩ රෝග හඳුනා ගැනීමේදී අනුගමනය කෙරෙන සිද්ධාන්ත හා මූලධර්ම 53-62

3.1 සාම්ප්‍රදායික වෙදකම යනු කුමක් ද?

3.2 ආයුර්වේදය

3.3 ලෙඩරෝග හඳුනා ගැනීමේ සාම්ප්‍රදායික ක්‍රමශිල්ප හා රෝග නිවාරණ විධි

3.4 ශාන්තිකර්ම ආශ්‍රිතව කෙරෙන රෝග පරීක්ෂා විධි

හතරවන පරිච්ඡේදය


4. ශාන්තිකර්මයන්හි පිළිබිඹු වන මනෝචිකිත්සක ලක්‍ෂණ 63-114

4.1 මානසික රෝග

4.2 භූතරෝග

4.3 රෝග නිවාරණ ක්‍රම

4.4 ශාන්තිකර්ම ප්‍රතිකාර ක්‍රම හා මනෝචිකිත්සණය

4.4.1 යක්තොවිල්වල ආවේශ කිරීම

4.4.2 ආවේශ මාර්ගයෙන් යටිහිත විමසා බැලීමෙන් පසු යක්‍ෂාවේශය හැරයන බවට සිත එකඟ කරවා ගැනීම

4.4.3 රෝගියා තුළ ධනාත්මකව සිතුවිලි තහවුරු කරලීම සඳහා ශාන්තිකර්මවල කෙරෙන මනෝචිකිත්සා ක්‍රම

4.4.4 බියට මුහුණ දීමට සැලැස්වීමෙන් යක්තොවිල්වල කෙරෙන මනෝචිකිත්සණය

4.4.5 ශාන්තිකර්ම ප්‍රතිකාර ක්‍රමය ආධ්‍යාත්මික නොහොත් අධි මානසික ප්‍රතිකාර ක්‍රමයක් බව

4.4.6 අනුකරණාත්මක හා ප්‍රදර්ශන ක්‍රියාමාර්ගයෙන් කෙරෙන මනෝ චිකිත්සණය

4.4.7 කායික හා මානසික වත්පිළිවෙත්වලට යොමු කරවීමෙන් රෝගීනට මනෝචිකිස්සණයට මග සැලසීම

4.4.8 ශාන්තිකර්මවලදී සමාජ සහයෝගය ලබා දීම මාර්ගයෙන් කෙරෙන මනෝචිකිත්සණය


පස්වන පරිච්ඡේදය


5. ශාන්තිකර්ම ආශ්‍රිත චිකිත්සා ක්‍රමය හා බුදුසමය අතර ඇති සම්බන්ධය 115-126

6. නිගමනය 127-130

7. ආශ්‍රිත ග්‍රන්ථාවලිය 131-138

8. උපග්‍රන්ථ 139-143

# පළමු වැනි පරිච්ඡේදය

## 1.1 හැඳින්වීම

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිටම මනුෂ්‍යයින් තම දෛනික ජීවිතයේ දී මුහුණ පෑමට ලක්වූ අනේකවිධ ව්‍යසනයන්ගෙන් අත්මිදීම සඳහා විවිධ පිළිවෙත් ක්‍රමවල පිහිට පැතූහ. ලෙඩ රෝග වැළඳීම මෙන්ම ස්වභාවික සංසිද්ධීන්ගෙන් වන්නාවූ සියළු උපද්‍රවයන් ඔවුන් සැළකුවේ යක්ෂ, භූත, දේව ආදී අදෘශ්‍යමාන සංකල්පයන්ගේ බලපෑමෙන් සිදුවන්නක් හැටියට ය. ඉන් අත්මිදීම සඳහා ඔව්හු යන්ත්‍ර, මන්ත්‍ර, බලි, බිලි ආදියෙහි පිහිට පැතූහ.

මෙරට අද්‍යතන සිංහල ගැමි බෞද්ධ සමාජය අතර ද පූර්වෝක්ත අරමුණු හා බැඳුණු පිළිවෙත් ක්‍රම රාශියක් වේ. ඒවා අතර ලෙඩරෝග නිවාරණය මෙන්ම සෞභාග්‍යය, සශ්‍රීකත්වය මත පදනම් වු යක්තොවිල්, මඩුතෝත්‍ර හා බලියාග ආදී ශාන්තිකර්මවලට වැදගත් තැනක් හිමි වේ.

මෙම ශාන්තිකර්ම උඩරට, පහතරට හා සපරගමු යන පළාත්වලට ආවේණික වූ, සමාජමය හා සංස්කෘතිමය අනන්‍යතා ලක්ෂණ ප්‍රකට වනසේ සංවිධානය වී ඇති අතර ප්‍රාදේශීය වශයෙන් ඒ ඒ පළාත්වලට සුවිශේෂ වු ඒවාද වෙත්.

මේ සම්බන්ධයෙන් පර්යේෂකයින් විසින් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ පර්යේෂණයන් සිදු කරති. නොයෙකුත් ක්ෂේත්‍රයන් අනාවරණය කොට ගනිති. එහෙත් ඉන් බහුතරයක් සිදු කොට ඇත්තේ එම පළාත්වල පවත්නා ශාන්තිකර්මවල ප්‍රභවය, විකාශය හා ඒවායෙහි අන්තර්ගත සාම්ප්‍රදායික වත් පිළිවෙත් ආදිය මුල් කොටගෙනය. එබැවින් මෙම අධ්‍යයනයේදී අපගේ විශේෂ අවධානය යොමු වන්නේ ලෙඩ රෝග සුව කිරිම සඳහා වන ප්‍රබල මනෝචිකිත්සක ක්‍රමයක් හැටියට එම ප්‍රතිකාර ක්‍රමයන්හි පෙනෙන වටිනාකම් කෙබඳුදැයි යන්න හඳුනා ගැනීමක් කෙරෙහි ය. ඒ සඳහා අප යොමු වූයේ කායික වශයෙන් කෙරෙන ප්‍රතිකාර ක්‍රමයක ලක්ෂණවලට වඩා මානසික ප්‍රතිකාර ක්‍රමයක ලක්ෂණ මෙම වත් පිළිවෙත් ක්‍රමයන්හි ඍජුවම දක්නට ලැබෙන බවට හැඟී ගිය බැවිණි. එපමණක් නොව නූතන වෛද්‍ය ක්ෂේත්‍රය තුළ මානසික රෝග සුව කිරීම

සම්බන්ධයෙන් භාවිත චිකිත්සා ක්‍රමයන්හි ඇතැම් ලක්ෂණ මෙම සාම්ප්‍රදායික ප්‍රතිකාර ක්‍රමයන්හි පිළිබිඹු වන සෙයක් ද පෙනෙන්නට ඇත.

එබැවින් මෙම චිකිත්සා ක්‍රමයන් කිසියම් විද්‍යාත්මක පදනමක් මත පිහිටා ගොඩ නගන ලද්දක් ද යන්න විමසුමට ලක්විය යුතු කරුණකි. එමගින් වර්තමාන සමාජය අතර විවිධ මානසික ව්‍යාකුලතාවන්ගෙන් හටගන්නා රෝග සමනය කර ගැනීම සඳහා මෙම චිකිත්සා ක්‍රමයන් භාවිතයට ගැනීම සඳහා මගපෙන්වීමක් ද කළ හැකි වන්නේ ය. එය අපගේ පාරම්පරික සංස්කෘතික උරුමයන් නොනැසී පවත්වාගෙන යාම සඳහා රුකුලක් ද විය හැක.

උක්ත අරමුණු පෙරදැරි කොටගත් මෙම අධ්‍යයනය සඳහා අප විසින් ඇසුරු කොට ගන්නා ලද්දේ සපරගමු පළාතේ පවත්නා ශාන්තිකර්මයෝයි. එසේ වෙන් කොට ගන්නා ලද්දේ මෙහි විෂය ක්ෂේත්‍රය සීමා කොට ගැනීමේ අරමුණ මතය. ඒ අනුව තත් ප්‍රදේශයේ දෙවියන් මුල්කොට කෙරෙන මඩුතෝත්‍ර හා බලියාග මෙන්ම, යක්ෂයින් මුල් කොට කෙරෙන යක්තොවිල් ආදියත් දක්නට ලැබේ. මෙම ශාන්තිකර්ම පද්ධතිය තුළ අතීතයේ විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලැබූ මඩුයාග හා යක්තොවිලයවල් පැවැතිය මුත් වර්තමානයේ යම්පමණකට හෝ දක්නට ලැබෙන්නේ ඒවායින් සීමිත සංඛ්‍යාවක් පමණි. ඒ පහන්මඩු, කිරිමඩු, දානෙමඩු, ගිණිමඩු හා බලියාග ආදිය ද හැන්දෑසමයම, කුමාරසමයම, සන්නියකුම හා දෙහි තොවිලය හෙවත් දෙහිමඩුව වැනි යක්තොවිල් ආදියත් ය. ඊට අමතරව තෙල්, නූල්, නානු, ජලය ආදී ද්‍රව්‍ය සහ විවිධ ඖෂධ වර්ග මැතිරීමෙන් බාහිර හා ආභ්‍යන්තරික (ශාරීරික) වශයෙන් කෙරෙන චිකිත්සා ක්‍රමයන් ද දක්නට ලැබේ.

මෙම අධ්‍යයනයේදී ඉහත සඳහන් කරන ලද පිළිවෙත් ක්‍රමයන් සියල්ලක්ම පාහේ අපට සියැසින් දැක බලා ගැනීමට හැකි විය. එම චිකිත්සා ක්‍රමවලදී රෝගී මනස නිරෝගී කරවීම සඳහා යකැදුරන් විසින් ගනු ලබන ක්‍රමෝපායයන්හි පෙනෙන මනෝචිකිත්සමය වටිනාකම් විවිධ පැතිකඩ ඔස්සේ විමර්ශනයට ලක් කෙරිණ.

එහි දී නූතන මනෝචිකිත්සකයින් විසින් මානසික රෝග සුව කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන චිකිත්සා ක්‍රමයන් කෙරෙහි ද අවධානය යොමු කෙරිණ.

ඒ කවර හේතුවක් මත ද යත්? මෙම සාම්ප්‍රදායික චිකිත්සා ක්‍රමයන්හි ඇතුළත් මනෝ විද්‍යාත්මක අගයයන් මතුකොට දැක්වීම සඳහා එම ප්‍රතිකාර ක්‍රමයන් හඳුනා ගැනීමත් පිටුවහලක් වෙතැයි සිතූ බැවිනි.

එම කරුණු පදනම් කොටගෙන මෙහි දී විශේෂයෙන් යක්තොවිලයවල භූතරෝග නිවාරණය කරන විට රෝගියාට මනෝ චිකිත්සනය සැලසීම සඳහා ගනු ලබන උපාය මාර්ගයයන් කවරේදැයි යනු ඉතා ගැඹුරින් විමර්ශනයට ලක් කෙරෙනු ඇත. මේ හැර සෑම ශාන්තිකර්මයකම පාහේ පොදුවේ අන්තර්ගත යක්කම්, පෙළපාලි ආදියත් ඒ හා බැඳුණු නර්තන, ගායන, වාදන, දෙබස්, සංවාද, රංග උපකරණ හා මෙවලම් ආදියත් උක්ත අරමුණ සඵල කර ගැනීමෙහිලා භාවිතයට ගැනෙන ආකාරය විමසා බැලෙනු ඇත. එපමණක් නොව මෙම වත් පිළිවෙත්වල නිරත වන ඇදුරු පක්ෂය ද ඊට පාත්‍රවන ආතුර පක්ෂයත් හා සමාජ සමූහයාත් විෂයෙහි පවත්නා සාම්ප්‍රදායික සිරිත් විරිත් හා ඇවතුම්, පැවතුම් ආදිය ආතුර මනස මනෝචිකිත්සනයෙහිලා කවර මෙහෙයක් ඉටු කරත්ද? යන්න අධ්‍යයනයට ලක් ව තිබේ.